
පළමුවෙනි සභාපතිත්වයේ පණිවුඩය, මාර්තු 2017

**සභාපති හෙන්රි බී. අයිරින්**



# ධර්මිෂ්ටකමින් සන්නද්ධවීම

පොළොව මත සිටින දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරයා වන සභාපති තෝමස් එස්. මොන්සන් මෙසේ කියා ඇත, “අද විශාල ලෙස පාපය, දුසිරිත සහ නපුර, කිසිදා නොවූ ලෙස, අපේ ඇස් ඉදිරියේ කඳවුරු බැඳ ඇත.”[1]

සභාපති මොන්සන් වසර 50කට පෙර එම වචන ප්‍රකාශකිරීම ගැන ඔබ පුදුමවන්නේද? දුෂ්ට බලවේග ඒ කාලයේ කිසිදා නොවූවිරූ ලෙස තිබූ දුෂ්ටකමට විරද්ධව අප කඳවුරු බැඳ නොතිබුනේ නම්, කෙතරම් වැඩියෙන් අද අපට එම නපුර තර්ජනයක්ව තිබෙන්නේද? යහපත් හේතුවකට, ස්වාමීන්වහන්සේ අපේ කාලපරිච්ඡේදය ගැන මෙසේ ප්‍රකාශකර ඇතිසේක, “බලන්න, සතුරා එකතුවී ඇත” (බලන්න ඕසහසී 38:12).

“අප සියල්ලෝම ඇතුලත්ව සිටින”[2] එම යුද්ධය ආරම්භවූයේ අප පොළොවේ ඉපදීමටත් පෙරය.. එය පටන්ගත්තේ පොළොව මැවීමටත් පෙරය. එය ආරම්භවූයේ මෙලොවට පෙර රාජ්‍යයේ සහස්‍ර ගණනාවකට පෙර, සාතන් කැරලි ගසමින්, “මිනිසාගේ කර්තෘත්වය විනාශකිරීමට සෙවූ කාලයේය” (බලන්න මෝසෙස් 4:3).

සාතන් එම සටන පරාජයවී, “පොළොවට නෙරපාහරින ලදී” (එළිදරව් 12:9), අද ඔහු එහි ඔහුගේ යුද්ධය කරමින් සිටී. මෙහි පොළොව මත “ඔහු දෙවියන්වහන්සේගේ ශුද්ධවන්තයන්ට විරුද්ධව යුද්ධකරමින් සහ ඔවුන්ව වටකරමින් සිටියි” (බලන්න ඕසහසී 76:29) බොරුව, රැවටීම සහ පරීක්ෂාවන්ද කරයි.

ඔහු අනාගතවක්තෘවරුන් සහ ප්‍රේරිතවරුන්ට විරුද්ධව යුද්ධකරයි. ඔහු පතිවෘත්තාවේ නීතිය සහ විවාහයේ පවිත්‍රත්වයට විරුද්ධව යුද්ධකරයි. ඔහු පවුල සහ දේවමාළිගාවට විරුද්ධව යුද්ධකරයි. ඔහු යහපත, ශුද්ධත්වය සහ පූජනීයව තිබෙන දේවලට විරුද්ධවද යුද්ධකරයි.

එවන් සතුරෙක් හා අපි සටන්කරන්නේ කෙසේද? අපේ ලෝකය ගිලදමන එවන් නපුරකට විරුද්ධව අපි සටන්කරන්නේ කෙසේද? අපගේ යුද ඇඳුම කුමක්ද? අපගේ මිත්‍රපක්ෂය කවුරුන්ද?

## බැටළු පැටවාණන්ගේ බලය

සාතන්ට අප කෙරෙහි බලය තිබෙන්නේ අපි ඔහුට අවසර ලබාදෙන ප්‍රමාණය අනුව බව, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් ඉගැන්වීය.[3]

අපගේ කාලය දැක, නෙපී, “දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන්ගේ බලය දුටුවේය. එය බැටළු පැටවාණන්ගේ සභාවේ ශුද්ධවන්තයන් මතද, මුළු පොළොව මතද විසිරී සිටින ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් ජනතාව වෙත පතිතවිය; තවද *ඔවුහු ධර්මිෂ්ටභාවයෙන් සහ බලවත් මහිමයෙන් දෙවියන්වහන්සේගේ බලයෙන් සන්නද්ධවූහ*” (1 නෙපී 14:14;අවධාරණ ඇතුලත්ය).

අපි ධර්මිෂ්ටකමින් සහ බලයෙන් සන්නද්ධවන්නේ කෙසේද? අපි සබත්දිනය ශුද්ධව තබාගනිමින් පූජකවරයට ගරුකරන්නෙමු. අපි පූජනීය ගිවිසුම් තබමින්, ආරක්ෂාකරන්නෙමු. අපගේ පවුල් ඉතිහාස කටයුතු කරමින්, දේවමාළිගාවට සහභාගිවන්නෙමු. අපි නොකඩවා පසුතැවෙමින්, “අපගේ පාපයන්ට සමාව ලබාගන්නා පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීමේ රුධිරය අපට ආලේප කරන්න” යයි ස්වාමීන්වහන්සේට ආයාචනාකරන්නෙමු (මොසායා 4:2). අපි යාච්ඤාකර, සේවයකර, ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ක්‍රියාත්මකකර, සාක්ෂිදරන්නෙමු.

අපි ධර්මිෂ්ටකමින් සහ බලයෙන්ද අපව සන්නද්ධකරමින් , “ජීවනයේ වචන [අපගේ] සිත් තුල නිරන්තරයෙන් අගයකරන්නෙමු.” (ඕසහසී 84:85 ) අපි එම වචන ශුද්ධ ලියවිලි තුල සහ ස්වාමීන්වහන්සේගේ තෝරාගත් සේවකයන්ගේ වචන තුල, අපව ගිල්වමින්, අගයකරන අතර, ඔවුන් උන්වහන්සේගේ කැමැත්ත, සහ හඬ (බලන්න ඕස හසී 68:4) ඊළඟ මාසයේ ප්‍රධාන සම්මන්තනයේදී බෙදාගන්නවා ඇත.

නපුරට විරුද්ධව කරන අපගේ සටන තුළ, තිරයේ දෙපැත්තෙන්ම අපට උපකාර තිබෙන බව අප නිතරම මතකතබාගත යුතුය. අපගේ මිත්‍රපක්ෂයට දෙව්වූ සදාකාලික පියාණන්වහන්සේ, ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේද ඇතුළත්ය.

අපේ මිත්‍ර පක්ෂයට ස්වර්ගයේ නෙපෙනෙන හමුදාද ඇතුළත්ය. “භය නොවන්න,” නපුරු හමුදාවට මුහුණදුන් බියට පත් තරුණයාට එලිෂා කීවේය, “මක්නිසාද ඔවුන් සමග සිටින්නන්ට වඩා අප සමග සිටින්නෝ බොහෝ යයි කීවේය” (බලන්න 2 රාජාවලිය 6:15–16).

අප බියවිය යුතු නැත, දෙවියන්වහන්සේ තම ශුද්ධවන්තයන්ට ප්‍රේමකරන සේක. උන්වහන්සේ කිසිදා අප අත්හරින්නේ නැත.

දෙවියන්වහන්සේ යාච්ඤාවට පිළිතුරු දෙමින්, නපුරින් මා මුදවන මෙන් කළ මගේ ආයාචනය ඉෂ්ටකළ බව මම දනිමි. දෙව්වූ පියාණන්ගේ සහ ලෝකයේ ගැලවුම්කරුවාණන්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේගේ උපකාරය සමගින්, අපි මුහුණදෙන ඕනෑම නපුරු හමුදාවකට, විරුද්ධවීමට ප්‍රමාණවත් බලය අපට ලබාදෙන බවට අපට සහතිකවිය හැකි බවට මම සාක්ෂිදරමි.

නිතරම ධර්මිෂ්ටකමින් සන්නද්ධවීමට අපට හැකිවේවා, එවිට අවසාන ජයග්‍රහනය ගැන විශ්වාසයක් තැබීමට අපට හැකිය.

**සටහන්**

1. තෝමස් එස්. මොන්සන්, “Correlation Brings Blessings,” *Relief Society Magazine, අප්‍රේ.* 1967, 247.
2. “We Are All Enlisted,” *Hymns,*අංක. 250.
3. බලන්න *Teachings of Presidents of the Church: Joseph Smith* (2007), 214.

---

## මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

අපි නපුරට විරුද්ධ යුද්ධකරන බව සභාපති අයිරින් අපට සිහිපත්කරයි. ඔබ උගන්වන අය සමග “We Are All Enlisted” (*ගීතිකා අංක.* 250) ගායනාකිරීම මගින් ආරම්භකිරීමට ඔබට හැකිය. ඉන්පසුව ඔවුන් සාතන්ට විරුද්ධව ධර්මිෂ්ටකමින් සහ මානසිකත්වයෙන් යුතුව ඔවුන්ගේ පවුල ආරක්ෂාවන අන්දම ගැන බෙදාගැනීමට ඔවුන්ට ආරාධනාකිරීමට ඔබට හැකිය. ඒවා නම් යහපත් මාධ්‍ය, පවුල් උපදෙස් සභා පැවැත්වීම, හෝ සතිපතා පවුල් නිවාස සැන්දෑ පැවැත්වීමයි. ඔවුන්ගේ පවුල් ශක්තිමත්කිරීම ගොඩනගන අන්දම ගැන යාච්ඤාකර සිතාබැලීමට ඔවුන්ට අභියෝගකර, ඔවුන්ගේ අදහස් ක්‍රියාත්මකකිරීමට සැලසුමක් සෑදීමට ඔවුන්ව දිරිමත්කරන්න.

## තරුණ අය

## මම දැනටත් තීරණයකර ඇත

මැඩිසන් තොම්ප්සන් විසිනි

වරක් තරුණ කාන්තා පංතියකදී මට ලිංගික පවිත්‍රත්වය ගැන වටිනා පාඩමක් ලැබින–එම මාතෘකාවෙන් ආසනවල හිඳගෙන සිටි බොහෝ තරුණ කාන්තාවෝ ඇඹරෙමින් සිටියහ. එදා මා ඉගෙනගත් දේවල් සියල්ල මට මතක නැත, නමුත් මගේ නායිකාව ඇගේ එක් පුද්ගලික ප්‍රමිතියක් ගැන කථාකිරීම මට මතක ඇත—නිතරම ලිංගිකව පිරිසිදුව සිටීමයි. ඇගේ වචන මට මතක තිබෙන අතර, ඉන්පසුව මම එය මාගේම පුද්ගලික ප්‍රමිතියක් ලෙස එකතුකිරීමට දැඩි තීරණයක් ගතිමි.

එක් දිනක් මා ක්‍රීඩා තරඟයකින් පසුව බස්රියෙන් නිවස බලා යන විටදී, සත්‍යය හෝ අභියෝගය නම් තරඟයක් පටන්ගත්තේය. කම්මැලි නිසා, වෙනත් ළමුන් කිහිපදෙනෙක් සමග මමද ඊට එක් වුනෙමු. මගේ වාරය පැමිණි විට, නිවැරදි නොවන බව මා දැන සිටි යමක් කිරීමට මට අභියෝග කෙරින. එය මට ගැනීමට තිබුන අසීරු තීරණයක් විය. නමුත් මගේ තරුණ කාන්තා නායිකාවගේ වචන මගේ සිතට ආ නිසා තේරීම පහසුවිය. ඊට සහභාගි නොවීම මම තෝරාගත්තෙමි, ඒ අවස්ථාවේ කළ යුතු දේ ගැන මම කලින්ම තීරණය කළෙමි.

අපි සභාවට ගොස් අපට එහිදී උගන්වන දේවල් ඉගෙනීමට පරිශ්‍රම දරන විට, මෙම ලෝකයේ පරීක්ෂාවලින් බේරී සිටීමට අපි විශාල ආත්මික ශක්තියක් සහ ආරක්ෂාවක් සමග ආශිර්වාදිතවන බව මම දනිමි.

*කතුවරයා ජීවත්වන්නේ යුටා ඇඑජ.*

## ළමයි

## ඔබගේ යුද්ධායුධ පැළඳගන්න

අද ලෝකයේ බොහෝ නරක දේවල් ඇත. ශුභාරංචිය පළිහක් ලෙස අපව ආරක්ෂාකරයි. අපගේ ආරක්ෂාව සඳහා සභාපති අයිරින් අපට කියන කාරණා 10 කියවන්න. ඉන්පසුව ඔබගේ පළිහ ඇඳ පාටකරන්න

- සබත් දිනය ශුද්ධව තබන්න
- පූජකවරයට ගරුකරන්න
- ගිවිසුම් තබා ආරක්ෂාකරන්න
- පවුල් ඉතිහාස කටයුතු කරන්න
- දේවමාළිගාවට යන්න
- පසුතැවෙන්න
- යාච්ඤාකරන්න
- අන්අයට සේවයකරන්න
- ඔබේ සාක්ෂිය බෙදාගන්න
- ශුද්ධලියවිලි කියවන්න

© 2017 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇව්රිණි. ඇඑජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/16. පරිවර්තන අනුමැතිය 6/16.
2017 March First Presidency message පරිවර්තනයයි Sinhala 97923-408

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ වන්දිගෙවීමේ හැකියාව දෙන බලය

ඇදහිල්ල පවුල සහ සහනය

*මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර, බෙදාගන්නේ මොනවාදැයි දැනගැනීමට ආනුභාවය සොයන්න. සහන සමිතියේ අරමුණ අවබෝධකරගැනීමෙන් දෙවියන්වහන්සේගේ දියණියන් සදාකාලික ජීවනයේ ආශිර්වාදවලට සූදානම්වන්නේ කෙසේද?*

"මා බලවත්කරන්නාවූ තැනැන්වහන්ස් තුල මට සියල්ල කළ හැකිය" (පිලිප්පි 4:13). "අපි සියල්ලන් තුල දුර්වලකම් තිබුනද, අපට ඒවා ජයගත හැකිය" යයි ඩීටර් එෆ්. උක්ඩෝෆ්, පළවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා කියයි. "ඇත්තවශයෙන්ම අපි අපව යටහත් පහත්කරගෙන, ඇදහිල්ල ඇතිව සිටීනම්, දෙවියන්වහන්සේගේ අනුග්‍රහය මගින්, දුර්වලකම් ශක්තිමත් වනු ඇත."[1]

අපගේ ගැලවුම්කරුවාණන්වහන්සේ දහම සහ ගිවිසුම තුලින් මෙසේ කියනසේක, "මම නුඹගේ මුහුණ ඉදිරියෙන් යමි, මම නුඹගේ දකුණු පාර්ශවයෙන් සහ නුඹගේ වම් පාර්ශවයෙන් යන්නෙමි, තවද මාගේ ආත්මය නුඹලාගේ හදවතේ තිබෙන්නේය, මාගේ දූතයෝ, නුඹලා දරාසිටීමට නුඹලා වටේ සිටින්නෝය" (බලන්න ඩීසහසී 84:88).

"නෙපී වනාහි ගැලවුම්කරුවාණන්ගේ හැකියාව දෙන බලය, දැනගෙන, තේරුම්ගෙන සහ විශ්වාසකළ අයෙකුගේ උදාහරණයක් බව" ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ, වැඩිහිටි ඩේවිඩ් ඒ. බෙඩ්නාර් කියයි. "නෙපීගේ සහෝදරයෝ ඔහුව රැහැන්වලින් බැඳ, ඔහුගේ විනාශය සැලසුම් කළහ. කරුණාකර නෙපීගේ යාච්ඤාව දෙස බලන්න: 'අහෝ ස්වාමීනී, ඔබවහන්සේ කෙරෙහි මා තුල ඇති ඇදහිල්ල අනුව, ඔබවහන්සේ මාගේ සහෝදරයන්ගේ හස්තවලින් මා ගලවාගන්නා සේක්ද; එසේය, මා බැඳ තිබෙන *මේ බැඳුම් පුපුරවා දැමීමට මට හැකිවීම පිණිස මට ශක්තිය පවා ලබාදුන මැනවි*' "(1 නෙපී 7:17; අවධාරණ ඇතුලත්ය).

"... නෙපී සිටි තත්වය වෙනස්කරීම සඳහා ඔහු යාච්ඤා කළේ නැත, ඒ වෙනුවට ඔහු තත්වය වෙනස්කරගැනීමට ශක්තිය පතා යාච්ඤා කළේය. මා විශ්වාසකරන පරිදි ඔහු මේ ආකාරයෙන් යාච්ඤා කළේ, වන්දිගෙවීමේ හැකියාව දෙන බලය ඔහු නිවැරදිව දැනගෙන, තේරුම්ගෙන අත්දැක තිබූ නිසාය.

"නෙපීව බැඳ තිබූ බැඳුම් ඔහුගේ අත්වලින් සහ මැණික්කටුවලින් මැජික්බලයෙන් ගැලවීගිය මම මා සිතන්නේ නැත. ඒ වෙනුවට, මා සැකකරන්නේ ඔහුගේ ස්වභාවික ශක්තිය අභිබවායන පවතින පුද්ගලික ශක්තියක් සඳහා ඔහු ආශිර්වාදිතවූ බවයි. එනම් ඔහු එවිට 'ස්වාමීන්වහන්සේගේ ශක්තිය තුලින්' (මොසායා 9:17) ක්‍රියාකර, රැහැන් අඹරවා, ගස්සාදමා, අවසානයේදී රැහැන් කඩාදැමීමට ඔහුට හැකිවූ බවය."[2]

## අමතර ශුද්ධ ලියවිලි සහ තොරතුරු

යෙසායා 41:10; ඊතර් 12:27; reliefsociety.lds.org

### සටහන්

1. ඩීටර් එෆ්. උක්ඩෝෆ්, "The Gift of Grace," *Liahona,* මැයි 2015, 108.
2. ඩේවිඩ් ඒ. බෙඩ්නාර්, "Strength Beyond Our Own," *New Era,* මාර්තු. 2015, 4.

### මේ ගැන සළකාබලන්න

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ හැකියාව දෙන බලය සහ උන්වහන්සේගේ වන්දිගෙවීමේ දිව් පූජාවට අපගේ දුර්වලකම් ශක්තිමත්කිරීමට හැකිවන්නේ කෙසේද?

© 2017 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ඇළුජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/16. පරිවර්තන අනුමැතිය 6/16.
2017 March Visiting Teaching message පරිවර්තනයයි Sinhala 97923 -408